



LAW & SOCIETY TRUST

## ප්‍රජාතන්ත්‍රවාදී සංවාදය, ක්‍රියාකාරී සවන්දීම සහ පුරවැසි සහභාගිත්ව අන්තර්ගතය: වසංගත සහ සමාජ අර්බුද අවස්ථාවන්හිදී පුරවැසි සහභාගිත්වය අන්තර්ගත කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව මුහුණපානු ලබන වසංගත සහ සමාජ- ආර්ථික අර්බුද අතරතුර පුරවැසි සහභාගිත්වය ඇති කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීතියේ ආධිපත්‍යය සහ මහජන වගවීම ශක්තිමත් කිරීමයි. වගකිවයුතු පුරවැසියන් ලෙස අපි ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ මූලධර්ම හා බැඳුණු අර්බුදයන්ට රජය විසින් ප්‍රතිචාර දැක්වීම තහවුරු කර ගැනීමට සහ රජය විසින් විශේෂයෙන් වැරදි තොරතුරු සහ වෛරී අදහස් හුවමාරු වීම වැළැක්වීම තහවුරු කිරීමට මෙන්ම වෙනස්කම් සිදු කරන්නන්ගේ සහ බලපෑම් ඇති කරන්නන්ගේ ධනාත්මක මැදිහත්වීම තුළ සමාජ සහයෝගීතාව ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, ව්‍යාපෘතිය මඟින් සෞඛ්‍යය සහ ආර්ථික අභියෝග සඳහා රජය විසින් ලබා දෙන වේගවත් ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම සඳහා නිල නොවන "පුරවැසි විමසුමක්" ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රතිපත්ති ගැටලු සඳහා මහජන කථිකාවක් ප්‍රවර්ධනය කිරීම, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම; ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් වලට බලපෑම් කරන අන්දමින් පැනනගින ගැටලු වලට පුරවැසියන්ට කාලෝචිත සහ සාධක හේතු කරගත් තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීමට මෙන්ම පුරවැසියන් හට පශ්චාත්- වසංගත සන්දර්භය තුළ තමන්ගේ අවශ්‍යතාවන්, උද්වේගයන් සහ අපේක්ෂාවන් ගෙනහැර දැක්වීමට හැකිවන අවශ්‍යතා ඇගයීමක් දියත් කිරීමට බලාපොරොත්තු වෙයි.

මෙම වාර්තාව ලියා ඇත්තේ ඉනෝමා කරුණාතිලක මහත්මිය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා දායකත්වයක් ලෙසය. නීතිය හා සමාජ භාරය විසින් ඔවුන් මෙම ව්‍යාපෘතියට සම්බන්ධවීම අගය කරනු ලබයි. ලිපිය තුළ දක්වා ඇති අදහස් කිසිසේත්ම නීතිය හා සමාජ භාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ කළමනාකාරීත්වයේ අදහස් පිළිඹිබු නොකරයි.

## පිටකවරය නිර්මාණය: සංගීත් මදුරාවල විසිනි

# අපි කොවිඩ්-19 වසංගත කාලය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ කථා කරමු

## *"අධ්‍යාපනය මූලික මිනිස් අයිතිවාසිකමක් වේ" - මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය*

කොවිඩ්-19 වසංගතය මානව ක්‍රියාකාරකම්වල සියලු ම අංශ කෙරෙහි, විශේෂයෙන් ම සෞඛ්‍ය, ජීවනෝපාය සහ අධ්‍යාපන යන අංශ කෙරෙහි ගෝලීය බලපෑමක් ඇති කර තිබේ. වසංගතයෙහි ප්‍රතිඵලයක් ලෙස පාසල් සම්පූර්ණයෙන් ම පාහේ වසා දැමීමට සිදු වූ අතර, එය ළමයින්ට දැඩි අවාසි සහගත තත්වයක් නිර්මාණය කර ඇත. පාසල යනු ළමයින් ඉගෙනීම සිදු කරන ස්ථානය පමණක් ම නොවේ. එය ළමයින් අනෙකුත් ළමයින් සමග අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කරමින් ඔවුන්ගේ සමාජ කුසලතා වර්ධනය කරගන්නා ස්ථානය ද වෙයි.[1] පාසල් තාවකාලිකව සහ දිගුකාලීනව වසා දැමීම සිසුන්ට සහ ගුරුවරුන්ට මෙන්ම පවුල්වලට ද බලපෑම් ඇතිකර තිබේ. එය මුළු මහත් ප්‍රජාවන් පුරා ම සිටින පුද්ගලයින්ට දැඩි සමාජ හා ආර්ථික පීඩාවන් ගෙන දී ඇත.

2020 මාර්තු 12 වන දින, ශ්‍රී ලංකා රජය වසංගතයට ප්‍රතිචාර දක්වමින් පාසල් ඇතුළු සියලු ම අධ්‍යාපන ආයතන වසා දමා, රටේ සියලු ම අධ්‍යයන ක්‍රියාකාරකම් අත්හිටවූයේය.[2] වසංගතයේ පළමු වන රැල්ල අවසන් වීමෙන් පසුව, 2020 ජූලි මාසයේ දී, තෝරාගත් ශ්‍රේණි සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ පාසල් නැවත විවෘත කරන ලද නමුත් නැවත වරක් නව කොරෝන වයිරසය පැතිර යාම ආරම්භ වූ බැවින් දින කිහිපයකට පසුව නැවතත් පාසල් වසා දමන ලදී. අවාසනාවකට, කොවිඩ් රෝගීන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වූයේ රටේ වැඩිම ජන ඝනත්වයක් ඇති ප්‍රදේශය වන බස්නාහිර පළාතෙන් ය. එබැවින්, බස්නාහිර පළාතේ පාසල් හැර, රටේ අනෙකුත් සියලු ම ප්‍රදේශවල පිහිටි පාසල් සහ අධ්‍යාපන ආයතන 2020 අගෝස්තු 10 වැනි දින යළි විවෘත කිරීමට රජය තීරණය කළේය.[3] කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ලෙහි සීඝ්‍ර වර්ධනය හේතුවෙන් ශ්‍රී ලංකාව පුරා පිහිටි සියලු ම අධ්‍යයන ආයතන 2020 ඔක්තෝබර් 5 වැනි දින සිට නැවත දැනුම් දෙන තුරු වසා දමන ලදී.[4]

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය පෙර නොවූ විරූ ආකාරයේ විවිධ අභියෝග වලට මුහුණ දුන්නේය. ජාතික විශ්වවිද්‍යාල [5] සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සහ 10,266 ක් වූ රජයේ සහ පෞද්ගලික පාසල් වසා දැමීමත් සමග සිසුන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම්වලට දැඩි බලපෑම් එල්ල විය.[6] මෙම තත්වය හමුවේ සිසුන් බඳවා ගැනීම්, විභාග, උපාධි ප්‍රදානෝත්සව සහ විෂය බාහිර ක්‍රියාකාරකම් ආදී සියල්ල තාවකාලිකව කල්දැමීමට සිදු විය.[7] ප්‍රදේශ වසා දැමීම් සහ සංචරණ සීමා පැනවීම් හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළී සිටින බොහෝ සේවකයින් නිසි කලට සිය වැටුප සහ අනෙකුත් දීමනා ලබා ගැනීම සම්බන්ධ දැඩි අභියෝගවලට මුහුණ දුන්හ. අධ්‍යාපන ආයතනවල සේවය කරන, දෛනික වැටුප් ලබන සේවකයින් ද මෙහි බලපෑමට ලක් විය.

**ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකුගේ ප්‍රකාශය (පිරිමි, වයස අවුරුදු 25, නාවලපිටිය)**

"අධ්‍යාපන ක්ෂේත්‍රයට අති විශාල බලපෑමක් සිදුවී තිබෙනවා. 2019 වර්ෂයේ දී පෙර පාසලට ගිය ළමයි දැන් ඉන්නෙ 1 හෝ 2 ශ්‍රේණියේ. දැන් 5 ශ්‍රේණියේ ඉන්න ළමයින්ට 4 ශ්‍රේණියට අදාළ දැනුම ලබා ගන්න බැරි වුණා. ඒ වගේම, සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ට තවමත් ප්‍රතිඵල ලැබිලා නැහැ. වසංගතය නිසා මෙම ක්‍රියාවලිවල ප්‍රමාදයක් තිබෙනවා. 2020 වසරේ උසස් පෙළ කරපු සිසුන්ට වසංගතයේ බලපෑම ඇතිවුනේ ඔවුන්ගේ අන්තිම මාස කිහිපයේ දී පමණක් නිසා ඔවුන් එතරම් ම දුෂ්කරතාවයකට මුහුණ දුන්නේ නැහැ. නමුත් 2021 වසරේ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන් ගැටලු රාශියකට මුහුණ දෙනවා. ඔවුන්ට නිසි පදනමක් නැහැ. ඔන්ලයින් ඉගැන්වීමේ උත්සාහය එතරම් ප්‍රායෝගික හා ඵලදායී නැහැ. ඔන්ලයින් ක්‍රමවේදය අධ්‍යාපන ක්‍රියාවලියට ඒකාබද්ධ කර ගැනීම අපහසු දෙයක්. ළමයින්ට ඔන්ලයින් අධ්‍යාපනය හා සම්බන්ධ මානසික බාධක තිබෙනවා. සමහර ළමයි නිසි ලෙස පන්තිවලට සහභාගි වන්නේ නැහැ. මෙම වසර එකහමාරක කාලය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල හිදැසක් නිර්මාණය කර තිබෙනවා. දැනුම අලුත් කර ගැනීම ඉතා ම දුර්වලයි. එපමණක් නොවෙයි, ළමයි ක්‍රීඩා වැනි විෂය බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගී වන්නේ නැහැ. ඔන්ලයින් අධ්‍යාපනයට වැය වන මුදලත් අධිකයි. සමහර ප්‍රදේශවලට නිසි අන්තර්ජාල සම්බන්ධතාවයක් නැහැ; පවුල්වලට ඒ සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් ඇත්තෙත් නැහැ. සමහර අය 2019 දී එල්.එල්.බී. උපාධිය සම්පූර්ණ කළ නමුත් පවතින තත්ත්වය මත ඔවුන්ට තවමත් නීතිඥ විභාගයත්, ආධුනික පුහුණු කාලයත් සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබෙනවා. බොහෝ ක්ෂේත්‍රවල ප්‍රමාදයක් තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින මෙම ගැටලු මගහරවා ගැනීමට නිසි වැඩපිළිවෙළක් නැහැ."

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ගුරුවරුන්ට සහ සිසුන්ට 'ඔන්ලයින්' (මාර්ගගත) ක්‍රමයට සිය අධ්‍යාපන කටයුතුවල සහ පුහුණුවීම්වල නියැළීමට සිදු විය. 'ඔන්ලයින් අධ්‍යාපනය' යන සංකල්පය ශ්‍රී ලංකාවට නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශයක් වූ බැවින් සහ බොහෝ ගුරුවරුන් සහ සිසුන් එයට මුහුණ දීම සඳහා සම්පූර්ණයෙන් ම සන්නද්ධව නොසිටි බැවින් එය මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල වෙනසක් ඇතිකරවන්නක් විය. නව තාක්ෂණය ඔවුන්ට නුහුරු දෙයක් විය; ඒ සඳහා අවශ්‍ය උපකරණ සහ අන්තර්ජාල සම්බන්ධතාවය ද, නවීන මෙවලම් සහ තාක්ෂණය භාවිතා කිරීමේ කුසලතාවය ද ඔවුන්ට නොතිබුණි.[8] ගුරුවරුන් සහ සිසුන් යන දෙපාර්ශ්වය ම අභියෝග කිහිපයකට මුහුණ දුන්හ.

**ප්‍රජා සේවිකාවක සහ වගාකරන්නියක වන කාන්තාවක ගේ ප්‍රකාශය (වයස අවුරුදු 46, කැකිරාව, අනුරාධපුරය)**

"මේක මගේ ගමේ පවුල්වලටත් බලපා තිබෙන විශාල ප්‍රශ්නයක්. වසංගතය හේතුවෙන් පාසල් වසා දැමීමෙන් පසුව, බොහෝ අධ්‍යාපන වැඩසටහන් ඔන්ලයින් ක්‍රමයට මාරු වුණා. ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අපිට ඇන්ඩ්‍රොයිඩ් දුරකථනයක්, ඩේටා සහ අන්තර්ජාල ආවරණය ඇතුළු බොහෝ පහසුකම් අවශ්‍ය වෙනවා. අපේ ගමේ බොහෝ පවුල්වලට මෙම දුරකථන වත්, ඒවා මිලදී ගන්න තරම් ආර්ථික ශක්තියක් වත් නැහැ. ඔන්ලයින් අධ්‍යාපනය සඳහා වුනත් ඩේටා වලට ඉතා විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වෙනවා; බොහෝ විට මේ පවුල් වලින් බහුතරයකට එය දැරිය නොහැකි තරම් ඉහළ මිලක්. තවත් ප්‍රධාන ම ගැටළුවක් තමයි අන්තර්ජාල ආවරණ සහ 'සිග්නල්' නොමැති වීම. මේ ඇමතුම ගන්න වුනත් මට ආවරණය තිබෙන එක ස්ථානයකට එන්න සිද්ධ වුණා. මගේ දුව දැන් ඉන්නෙ 5 ශ්‍රේණියේ; ඇය ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වෙමින් ඉන්නෙ. ඇයට උපකාරක පන්තිවල සහායත් අවශ්‍ය වෙනවා. ඒ සඳහා ඇයට ඔන්ලයින් පන්තිවලටත් සහභාගි වෙන්න සිද්ධ වෙනවා. ඇය පවසන පරිදි, ඔන්ලයින් ක්‍රමයට අධ්‍යාපනය ලබන එක තරමක් අපහසු දෙයක්. ඒ සඳහා පහසුකම් සැලසීමේ දුෂ්කරතා මෙන් ම ඉගෙනීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දුෂ්කරතාවයනුත් තිබෙනවා. ඒ වගේම, පාසල් යන වයසේ ළමයි දෙතුන් දෙනෙක් ඉන්න පවුල් තියෙනවා. ඔවුන් සියලු දෙනාට ම ඔන්ලයින් අධ්‍යාපනය සමග සම්බන්ධ වෙන්න අවශ්‍ය වෙනවා. ඒකට පහසුකම් සලසන්න ඒ සෑම ළමයෙකුට ම එක් දුරකථනය බැගින් සපයා දීම ඉතා අපහසුයි. සමහර ප්‍රදේශවල ළමයි කිහිප දෙනෙක් එකට එකතු වෙලා එක දුරකථනයකින් පන්තිවලට සම්බන්ධ වෙන්න උත්සාහ කරනව මම දැකල තියෙනවා."

### *තොරතුරු තාක්ෂණ (IT) දැනුම නොමැතිකම*

අභිමුඛ ඉගැන්වීම, කට පාඩම් කිරීම මගින් ඉගෙනීම සහ අන්තර්ක්‍රියාකාරී ඉගෙනීම වැනි ක්‍රියාවලීන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන තුළ ස්ථාපනය වී ඇති ක්‍රම වේ. 'ඔන්ලයින්' අධ්‍යාපනය ශ්‍රී ලාංකික සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද නව සංකල්පයක් වේ. එම නිසා, මෙම සම්ප්‍රදායයන් බිඳ දමමින් නව්‍ය වූ මාර්ගගත පරිසරයක් තුළ ළමයින්ට අධ්‍යාපනය ලබා දීම දුෂ්කර ය. වසංගතය ඇතිවීමට පෙර පැවති තත්වය තුළ පවා ශ්‍රී ලංකාව තුළ

'ඔන්ලයින්' අධ්‍යාපනය පිළිබඳ සංකල්පය හඳුන්වා දීම සහ දියුණු කිරීම මන්දගාමී විය. 'ඔන්ලයින්' ක්‍රමයට ඉගෙනීම සහ ඉගැන්වීමේ වේදිකාවක් ලෙස තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් බලධාරීන්ට පුළුල් ප්‍රතිපත්තියක් හෝ ප්‍රවේශයක් නොතිබුණි. ඔවුහු ගුරුවරුන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ නිසි පුහුණුවක් ලබා නොදුන් අතර, සියලු ම පාසල්වලට සහ ප්‍රදේශ වලට අවශ්‍ය උපකරණ හෝ යටිතල පහසුකම් හෝ සපයා නොදුන්හ.[9] සිසුන්ට මෙවැනි තාක්ෂණික උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට හැකි වන පරිදි අවශ්‍ය ආධාරක පද්ධති (අන්තර්ජාල සම්බන්ධතා සහ සාමාන්‍ය විදුලි සැපයුම් වැනි) තිබේද යන්න පිළිබඳ කිසිදු ඇගයීමක් සිදු නොකර, කලින් කලට, සහ වැඩි වශයෙන් ම මැතිවරණ පොරොන්දුවක් ලෙස, නොමිලේ ටැබ්ලට් ලබා දෙන බවට සිසුන්ට සහතික වෙන ලදී.

තමන් මත පැටවුණු අමතර බර නිසා බොහෝ ගුරුවරු අභියෝගයකට මුහුණ දුන් අතර, 'ඔන්ලයින්' පාඩම් සැලසුම් කර සිසුන්ට බෙදා හැරීමට ඔවුහු බලවත් පරිශ්‍රමයක් දැරූහ. එසේම, පාසල් සිසුන් ද නවීන තාක්ෂණය පිළිබඳ දැනුම නොමැතිකම නිසාත්, අවශ්‍ය උපාංග සහ අන්තර්ජාල සේවා වෙත ප්‍රවේශය නොතිබීම නිසාත් පීඩාවට පත් වූහ. බොහෝ පවුල්වලට අන්තර්ජාල සම්බන්ධතා සඳහා වියදම් දැරීමට ප්‍රමාණවත් තරම් සම්පත් නොමැති අතර, එකම පවුලේ දරුවන් කිහිප දෙනෙකු සිටින විට, සියලු ම දරුවන්ට අවශ්‍ය තරම් උපකරණ ඔවුන් සතුව නැත. තොරතුරු තාක්ෂණය පිළිබඳ යම් දැනුමක් ඇති සිසුන් තම අධ්‍යාපන කටයුතු කරගෙන යාමට සමත් වූ නමුත්, සිසුන්ගෙන් බොහෝ දෙනෙක් මෙම ක්‍රමය නිසා අවාසි සහගත තත්වයකට පත් වූහ. එසේම, බොහෝ දෙමව්පියන්ට නවීන තාක්ෂණය පිළිබඳ දැනුමක් නොමැතිකම හේතුවෙන් තම දරුවන්ට උපකාර කිරීමට නොහැකි විය.[10] තවද, පහළ ශ්‍රේණිවල දරුවන් සිටින දෙමව්පියන්ට මෙම කුඩා හා කලබල සහිත ළමයින්ගේ අවධානය යොමු කර තබා ගැනීම අපහසු වීම නිසා එම දෙමව්පියන් ද මෙම ක්‍රියාවලිය තුළ දුෂ්කරතාවයන්ට මුහුණ දුන්හ.

## *නිසි උපාංග නොමැතිකම*

බොහෝ සිසුන්ට, විශේෂයෙන් ම අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට, ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ හැකියාව නොතිබුණි.[11] බොහෝ විට, පවුල් සතුව එක් ස්මාර්ට් ජංගම දුරකතනයක් සහ එක් උපාංගයක් පමණක් ඇති අතර, බොහෝ ඉගැන්වීම් සැසි එකවර පැවැත්වෙන බැවින් දරුවන් කිහිප දෙනෙකු සිටින පවුල් සඳහා මෙය ප්‍රමාණවත් නොවේ. මෙය පවුලේ සහෝදර සහෝදරියන් අතර ගැටලු රාශියක් ඇති කරමින් පවුල් පරිසරය ද බිඳී යාමට හේතු වන බැවින් එය දෙමව්පියන් මත අමතර බරක් පටවයි. ඉහළ සමාජ-ආදායම් මට්ටම්වලට අයත් සහ වඩා හොඳ යටිතල පහසුකම් සහිත පවුල්වල ළමයින් අධ්‍යාපනය ලබන ප්‍රභූ පාසල්වලට මෙම බලපෑමෙන් මිදී සිටීමට හැකි වී තිබේ. එහෙත් සීමිත යටිතල පහසුකම් ප්‍රමාණයක් තිබෙන, සහ දිළිඳු පවුල්වල ළමයින් අධ්‍යාපනය ලබන, අඩු වරප්‍රසාද සහිත පාසල් දැඩි අවාසි සහගත තත්වයකට මුහුණ දී ඇත.[12]

## *ඩේටා ගැටළුව*

ළමයින් ඩේටා සඳහා මුදල් ඉල්ලමින් දෙමව්පියන්ට අමතර පීඩනයක් එල්ල කරති. ඩේටා සඳහා වන ගාස්තු ඉතා ඉහළ වන අතර, වසංගතය නිසා තම ආදායම සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් අහිමි වීම හේතුවෙන් බොහෝ දෙමව්පියන්ට සම්පූර්ණ ඩේටා පැකේජ මිලදී ගත නොහැක. එමෙන් ම, බොහෝ සිසුන්ට අවශ්‍ය උපාංග සහ දත්ත තිබුණ ද, අන්තර්ජාල ආවරණය දුර්වල වීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට නොහැකි විය.[13] සමහර ග්‍රාමීය ප්‍රදේශවල ගුරුවරුන්ට සහ පාසල් සිසුන්ට එම ප්‍රදේශවල පවතින එකම අන්තර්ජාල සේවා සංඥා වෙත ප්‍රවේශ වීම සඳහා ගලක් මතට නැගීමට සිදු වන බව මාධ්‍ය වාර්තා කළේය. උදාහරණයක් ලෙස, බෝහිට්ටිවාය ප්‍රදේශයේ ගුරුවරුන්ට සහ පාසල් සිසුන් 45 දෙනෙක් පමණ පිරිසකට අන්තර්ජාල සේවා සංඥා වෙත ප්‍රවේශ වීම සඳහා සැතපුම් දෙකකට අධික දුරක් පයින් ගමන් කර ගලක් මුදුනට නැගීමට සිදු වී තිබුණි.[14] මෙවැනි

අභියෝග මගින් අධ්‍යාපනය වෙත ඇති ප්‍රවේශයෙහි විෂමතා ඇතිකිරීම හේතුවෙන් දරුවන් අතර පරතරයන් නිර්මාණය කරයි.

**ප්‍රජා සේවිකාවක සහ වගාකරන්නියක වන කාන්තාවක ගේ ප්‍රකාශය (වයස අවුරුදු 61, කැකිරාව, අනුරාධපුරය)**

"අධ්‍යාපන ක්ෂේත්‍රය කඩා වැටිලා. මගේ දුවගේ ලොකු පුතා ඉන්නේ 7 ශ්‍රේණියේ. මේ දවස්වල ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු බොහොමයක් ඔන්ලයින් ක්‍රමයටයි සිදු කෙරෙන්නෙ. ඔවුන්ට දුරකථන සහ වෙනත් ආකාරවල උපකරණ නැහැ. ඔන්ලයින් පංති කරන්න ඔවුන්ට ඇන්ඩ්‍රොයිඩ් දුරකථනයක් අවශ්‍ය වෙනවා. බොහෝ විට මම මගේ ෆෝන් එක ඔහුට දෙනවා. නමුත් මමත් බොහෝ ප්‍රජා ක්‍රියාකාරකම් සිදු කරන නිසා මටත් සමහර වෙලාවට ඔන්ලයින් රැස්වීම් තිබෙනවා. එම අවස්ථාවල දී, අපි දෙදෙනාට ම දුරකථනය අවශ්‍ය වූ විට එය ඉතා ගැටළු සහගතයි. ඒ වගේම, අන්තර්ජාල සම්බන්ධතා සහ සංඥා ගැටළුත් තිබෙනවා. සමහර වෙලාවට අන්තර්ජාල සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා මට බොහෝ දුර ගමන් කිරීමට සිදු වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින මෙම දුෂ්කරතා මගහරවා ගැනීමට නිසි සැලසුමක් හෝ විසඳුමක් නැහැ. මෙම ඉගැන්වීමේ ක්‍රමය නිසා ගුරුවරුන් පවා ගැටලු රැසකට මුහුණ දෙනවා. පසුගිය වසරේ දී ගුරුවරු සිසුන් වෙත මුද්‍රිත සටහන් යැවීමට යම් උත්සාහයක් ගත්තා. ඒ වගේම සමහර ගුරුවරු WhatsApp හරහා ළමයින්ගේ දුරකථනවලට ක්‍රියාකාරකම් ලැයිස්තු යවා ඒ පිළිබඳ පසු විපරම් කළා. නමුත් එයත් නිසියාකාරව කරගෙන යන්න බැරි වුණා. 2020 මාර්තු මාසයේ සිට සියලුම ශ්‍රේණි අතර විශාල පරතරයක් නිර්මාණය වී තිබෙනවා. මෙය ඊළඟ පරම්පරාවට ඉතා අහිතකර ලෙස බලපෑ හැකියි. එපමණක් නොවෙයි, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන් ද බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙනවා. සමහරු ඉගෙනීම අතහැර දාල මොකක් හරි රස්සාවක් කරන්න හදනවා. නමුත් සමහරු විශ්වවිද්‍යාලවලට යනවා. ඔවුන්ට ගැටළු නැහැ. ඔවුන් තම කාර්යයන් නිසි ලෙස කරගෙන යනවා."

## ඉගෙනීම සීමාවීම්

අධ්‍යාපනය යනු ඥානන සහ විශ්ලේෂණ කුසලතා, විෂය බාහිර ක්‍රියාකාරකම්, සහ නිපුණතා පුහුණු කිරීම් ඇතුළත් වන පුළුල් සංකල්පයකි. එමෙන් ම, එය සමාජ අන්තර්ක්‍රියා සඳහා ද පදනම සපයා දෙයි. කොවිඩ් වසංගතයෙහි ප්‍රතිඵලයක් ලෙස, ළමයින්ට එළිමහන් ක්‍රියාකාරකම්, සමාජ අන්තර්ක්‍රියා සහ අන්තර් පුද්ගල සන්නිවේදනය, සහ ප්‍රායෝගික පුහුණු සැසි ආදියට සහභාගීවීමේ අවස්ථාව ද අවහිර වී ඇත.[15] ඵලදායි ලෙස 'ඔන්ලයින්' ක්‍රමයට පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා උපදේශකයින්ට සහ සිසුන්ට සෑම විටම අන්තර්ජාලය වෙත සහ දෘඩාංග උපකරණ හා මෘදුකාංග වේදිකා වෙත ප්‍රවේශය නොමැති තත්වය තුළ මෙම වසංගතය තාක්ෂණික සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වැනි වෘත්තීයවේදී ආයතනවලට ද දැඩි ලෙස බලපා ඇත.[16] එමෙන් ම, අන්තර්ජාලය හරහා ප්‍රායෝගික පුහුණුව ලබා දීම කළ නොහැක්කකි; එසේ නැතහොත් ඉතා දුෂ්කර කාර්යයකි.

පාසල් ගුරුවරුන් ඇතුළු උපදේශකයින්ට සිදු වී ඇත්තේ WhatsApp වැනි සමාජ මාධ්‍ය වේදිකා හරහා දේශන සහ පැවරුම් ලබා දීමට බැවින් ඔන්ලයින් තාක්ෂණය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශයක් ලබා නොදෙයි. රට වසා දමා තිබූ කාලය තුළ දී සියලු ම සිසුන්ට ඔන්ලයින් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ විය නොහැකි වූ බැවින් ඇතැම් විට විට පාසල් ගුරුවරුන්ට සහ උපදේශකයින්ට අභිමුඛ පුහුණුවීම් නැවත ආරම්භ වූ පසු ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ ඉගැන්වූ දේශන නැවත කිරීමට සිදුවිය හැක. මෙම සියලු සාධක සලකා බැලීමේදී, වසංගත කාලය තුළ දී නිවසේ සිට විශේෂ ක්‍රියාකාරකම්වල නිරත කරවීම හරහා ඉගෙන ගැනීමට සිසුන්ව යොමු කිරීමට ගුරුවරුන් සහ දේශකවරුන් උපරිම උත්සාහයක් දැරුව ද, මෙම කාලය තුළ දී ඉගෙනීමේ ගුණාත්මක භාවය දුර්වල වී සිසුන්ගේ හැකියාවන් සැලකිය යුතු ලෙස පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කොළඹ පිහිටි පෞද්ගලික සමාගමක බෙදාහැරීම් කළමණාකරුවෙකුගේ ප්‍රකාශය (පිරිමි, වයස අවුරුදු 34, බණ්ඩාරවෙල)**

"උසස් පෙළ විභාගයට පෙනී සිටීමට සූදානම් වෙමින් සිටින බොහෝ සිසුන් විශාල පීඩනයකට මුහුණ දෙනවා. පවතින තත්වය මත සෑම දෙයක් ම ප්‍රමාද වෙලා තියෙන්නෙ. ඔවුන් තම අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කර සිටීමට වෙහෙසෙනවා. විශ්වවිද්‍යාලවලට අලුතින් ම ඇතුළත් වූ සිසුන් සහ ඇතුළත් වීමට බලාපොරොත්තුවෙන් සිටින සිසුන් ද එසේමයි. ඉතා ඉක්මනින් ම පාසල්වල පන්ති නැවත ආරම්භ කරන්න පුළුවන් වෙන්න නම් පාසල් ළමයින්ට එන්නත් ලබා දෙන එක ඉතා වැදගත් කියල මම හිතනවා. අඩු තරමින් එය ඔවුන්ට ඔවුන්ගේ ප්‍රශ්න වලින් මිදිය හැකි යම් පදනමක් හෝ නිර්මාණය කරාවි. "

## ඉතා වැදගත් විභාග - අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ

දීර්ඝ කාලීන වසා තැබීම් හේතුවෙන් විභාග පැවැත්වීම රජය මුහුණ දී ඇති ප්‍රධාන ම අභියෝගයක් වී තබේ. උසස් පෙළ විභාගය සම්බන්ධයෙන් 2020 මැයි 03 වැනි දින සාධාරණ තීරණයක් ගන්නා බව විභාග කොමසාරිස් සනත් පූජිත ප්‍රකාශ කළේය. ඒ මත පදනම්ව 2020 මැයි මාසයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය උසස් පෙළ විභාගය සඳහා මාර්ගගත (ඔන්ලයින්) ක්‍රමයට අයදුම් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දුන්නේය. පැවති තත්වය මත, 2020 ජූනි මාසයේ දී, උසස් පෙළ සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග යන විභාග දෙක ම සැප්තැම්බර් මාසයට කල් තබන ලදී. නමුත් ජූනි 6 වැනි දින පාසල් නැවත ආරම්භ වූ පසු ඉහත සඳහන් විභාග දෙක පැවැත්වෙන දින පිළිබඳව අවසන් සාකච්ඡාවක් පවත්වන බව අධ්‍යාපන අමාත්‍යාංශය නැවත ප්‍රකාශ කළේය.[17] එම තීරණයෙහි පැවති අවිනිශ්චිතභාවය සිසුන්ට අහිතකර ලෙස බලපෑවේය. අවසානයේ දී විභාග දෙක ම 2020 ඔක්තෝම්බර් මාසයට කල් දමන ලද අතර, ඒවා රට වසා දමා තිබූ කාලය තුළ දී ම පවත්වන ලදී.

ප්‍රවේශ පත්‍රය සිසුන්ගේ ගමන් බලපත්‍රය ලෙස භාවිතා කළ හැකි වූ අතර, රජය සිසුන් සඳහා විශේෂ ප්‍රවාහන සේවාවක් ද සංවිධානය කළේය.[18] විභාග ප්‍රතිඵල ප්‍රමාද වූ අතර, අවසානයේ දී 2021 මැයි 4 වැනි දින ප්‍රතිඵල නිකුත් කරන ලදී. වසංගතය හේතුවෙන් විභාගයට අයදුම් කිරීමේ ක්‍රියාවලිය වෙනස් කර, රජය අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාර්ගගත ක්‍රමයක් හඳුන්වා දුන් අතර, අයදුම්පත් භාරගනු ලැබුවේ මාර්ගගත ක්‍රමයට පමණි.[19] එලෙස ම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය ද කල් දමන ලදී. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම ද ප්‍රමාද වූ අතර, අවසානයේ දී නිකුත් වූයේ විෂයන් 8 ක ප්‍රතිඵල පමණකි. ප්‍රායෝගික විභාග පැවැත්වීම ප්‍රමාද වීම නිසා සෞන්දර්ය විෂයන්හි ප්‍රතිඵල නිකුත් කිරීමට නොහැකි විය.

**කොළඹ පෞද්ගලික රෝහලක මානව සම්පත් කළමනාකරුවෙකුගේ ප්‍රකාශය (පිරිමි, වයස අවුරුදු 30, පැල්මඩුල්ල)**

"අධ්‍යාපනයෙහි ගතිකත්වය විසින් සමාජ ස්ථර නිර්මාණයවීම නැවත හැඩගස්වමින් තිබේ. පන්තිකාමරය තුළ සිදු කෙරෙන අධ්‍යාපනයට සාපේක්ෂව, අතථ්‍ය (මාර්ගගත) අධ්‍යාපනයේ දී සිසුන් වඩාත් පසුගාමී වෙමින් සිටිති. ගුරුවරයෙකු පන්ති කාමරය තුළ ඉගැන්වීම් සිදු කරන විට සිසුන්ව අන්තර් ක්‍රියා කිරීමට යොමු කරවීමේ විවිධ ක්‍රම තිබේ. ඔන්ලයින් තාක්ෂණය භාවිතා කිරීමේ දී එම අන්තර්ක්‍රියා සීමා වෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු වූ මෙම වෙනසත් සමග සිසුන්ට නිදහසේ අදහස් හුවමාරු කර ගැනීමට හා ඉගෙනීමට තිබූ අවකාශය හැකිලී ගොස් ඇත. අධ්‍යාපනයට විවිධ අදියර කිහිපයක් ඇත. එම සෑම අදියරයක් ම සිසුන්ට ඉගෙන ගැනීමට සහ අවබෝධය වැඩි දියුණු කිරීමට උපකාරී වෙයි. නමුත් දැන් ඔවුන්ට ඔන්ලයින් ඉගැන්වීම හරහා ලැබෙන්නේ පාඩමෙහි පළමු අදියර පමණකි."

නුදුරු අනාගතයේ දී විශ්වවිද්‍යාල විභාග ඔන්ලයින් ක්‍රමයට පැවැත්වීමේ ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු වී ඇති බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ප්‍රකාශ කළේය.[20] විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විවිධ සංසද යොදා ගනිමින් විකල්ප ඇගයීමක් සිදු කළ අතර, රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකර ගෙන යාම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහිත විශේෂ චක්‍රලේඛයක් නිකුත් කළේය.[21] එහි ප්‍රතිඵලයක් ලෙස, විභාග ඇතුළු අනෙකුත් අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව, වැඩි ප්‍රමාදයක් නොමැතිව ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය විශ්වවිද්‍යාලවලට හැකි විය.

**රාජ්‍ය විශ්වවිද්‍යාලයක කළමනාකරණ සහකාරවරයෙකුගේ ප්‍රකාශය (පිරිමි, වයස අවුරුදු 38, වාලච්චේන, මඩකලපුව)**

“ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා විශ්වවිද්‍යාල මට්ටටමෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. උදාහරණයක් ලෙස, මම නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපයේ සේවය කරන්නෙ; ඔවුන් සිසුන්ට සහ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට නොමිලේ වේදිකාවක් සපයා දීම සඳහා Zoom සමග ගිවිසුමක් අත්සන් කර, නොමිලේ අන්තර්ජාල පහසුකම් ද සපයා දෙනවා. නමුත් පාසල් මට්ටමේ දී ගුරුවරුන්ට සහ සිසුන්ට ප්‍රමාණවත් පහසුකම්වත්, තාක්ෂණය පිළිබඳ දැනුමක්වත් ලැබෙන්නේ නැහැ. ඒ වගේම ඇන්ඩ්‍රොයිඩ් දුරකථන මිලදී ගැනීම සඳහා මෙන් ම ඩේටා ගාස්තු සඳහාත් තමන්ගේ පෞද්ගලික මුදලින් වියදම් දැරීමට ඔවුන්ට සිදුවී තිබෙනවා. සමහර ගුරුවරු පාඩම් කට්ටල සහ ප්‍රශ්නපත්‍ර සකස් කර මුද්‍රණය කරනවා. ඒවා මුද්‍රණය කිරීමේ සහ බෙදාහැරීමේ වියදම් ඔවුන් විසින් ම දැරිය යුතු වන අතර ඒ සඳහා කිසිවෙකුගේ සහයෝගයක් ලැබෙන්නේ නැහැ. රට වසා තිබීම හේතුවෙන් ඡායා පිටපත් මධ්‍යස්ථාන වලින් බොහොමයක් වසා තිබෙන  නිසා සමහර විට ඡායා පිටපත් ලබා ගැනීමට ස්ථානයක් සොයා ගැනීමට මට දැඩි වෙහෙසක් දරන්න සිද්ධ වෙනවා. සිසුන් සඳහා සියලු ම පාඩම් බෙදා දීමට හැකි වන පරිදි රජයට ත්‍රෛභාෂා වෙබ් වේදිකාවක් ආරම්භ කළ හැකි යැයි මම සිතනවා. පාසල් විෂය මාලාව සඳහාත් එලෙසමයි; එවිට ඔන්ලයින් පන්ති පැවැත්වීම පහසු වෙනවා. ඒ සඳහා වන පිරිවැය ද අඩු වන අතර, එය සිසුන්ට සහ ගුරුවරුන්ට යම් සහනයක් ගෙන දෙයි. එසේම, සිසුන් සමග එකම අන්තර්ගතය බෙදා ගැනීම සඳහා වේදිකා ලෙස රූපවාහිනිය, ගුවන්විදුලිය සහ යූ ටියුබ් භාවිතා කළ හැකියි. වසංගතය අතරතුර දී පෘතුගාලයේ අධ්‍යාපන ක්‍රමය මේ ආකාරයෙන් ක්‍රියාත්මක වූ බව මට දැනගන්න ලැබුණා.”

## අන්තර්ජාලය අවභාවිතා කිරීම

බොහෝ පාසල් සිසුන් අන්තර්ජාලය අවභාවිතා කරන බව වාර්තා වී තිබේ. පාසල් උපදේශන ගුරුවරුන්ගේ වාර්තාවලට අනුව, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සමහර සිසුන්ට, විශේෂයෙන් ම යොවුන් වියේ ගැහැණු ළමයින්ට සහ පිරිමි ළමයින්ට සීමාවකින් තොරව අන්තර්ජාලය භාවිතා කිරීමේ අවස්ථාව උදාවුණා.[22] බොහෝ ශ්‍රී ලාංකික දෙමව්පියන් තම දරුවන්ට ජංගම දුරකථන, ටැබ්ලට් සහ ලැප්ටොප් පරිගණක වැනි විද්‍යුත් උපාංග වෙත සීමා රහිත ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාව ලබා නොදෙමින් ඔවුන් ඒවා වෙත ප්‍රවේශ වීම පාලනය කරන බව පැහැදිලි ය. මෙවැනි විද්‍යුත් උපාංග ලබා ගැනීමට මග බලමින් සිටි සිසුන්ට ඔන්ලයින් අධ්‍යාපනය මගින් ඒ සඳහා අවස්ථා නිර්මාණය කර දුන්නේය.[23] බොහෝ යොවුන් ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින් වසංගත කාලය තුළ දී වැඩිහිටියන් සඳහා වන වෙබ් අඩවිවලට සහ අන්තර්ජාල ක්‍රීඩා වලට ඇබ්බැහි වූ බවක් පෙනෙන්නට තිබේ.[24] සමහර ළමයින් ඔවුන්ගේ දෙමව්පියන්ට නොදැනෙන පරිදි සමාජ මාධ්‍ය හරහා අනවශ්‍ය සම්බන්ධතා ගොඩනගා ගත්හ. එවැනි ක්‍රියාවන්හි ඇති අවදානම පිළිබඳ ඔවුන්ට දැනුවත්භාවයක් නොමැතිකම නිසා, ඔවුන් වංචාවන්හි සහ පෙළඹවීම්වල ගොදුරු බවට පත්වී ඇති අතර, එය ඔවුන්ගේ ජීවිත උවදුරේ හෙලා ඇත.[25]

## ශාරීරික සහ මානසික සහ ඉගැන්වීමේ අභියෝග

කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ ආරක්ෂක ක්‍රියාමාර්ග ලෙස ශ්‍රී ලංකා රජය මහජනතාවට ශාරීරික දුරස්ථභාවය පවත්වා ගන්නා ලෙස උපදෙස් දෙමින්, අධි අවදානම් සහිත ප්‍රදේශ වසා දමා, ඇඳිරි නීතිය පනවමින් නිරෝධනය කිරීම් ක්‍රියාත්මක කළේය. සාමාන්‍යයෙන් පාසල් සිසුන් අධ්‍යාපන ආයතන තුළදී ඉතා අධික මට්ටමකින් සමාජ සහ ශාරීරික සම්බන්ධතා පවත්වති. එක්වරම, හුදෙකලා කිරීම් සිදු කර, සමාජ දුරස්ථභාවය පවත්වා ගත යුතු බවට නියම කිරීම ශිෂ්‍යයින්, දෙමව්පියන් සහ ගුරුවරුන් තුළ මානසික පීඩාවක් ඇතිවීමට හේතු වී තිබෙන අතර, ඔවුන් එම පීඩාව ඇඟවෙන විවිධ රෝග ලක්ෂණ පෙන්නුම් කරන බවක් පෙනෙන්නට තිබේ. විශේෂයෙන් ම, ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීම කොවිඩ් වසංගතය පැතිරීම වළක්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍යයෙන් ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් වන නමුත්, ශාරීරික දුරස්ථභාවය මගින් දීර්ඝ-කාලීන අහිතකර මනෝවිද්‍යාත්මක ප්‍රතිවිපාක ඇති වන බව සාක්ෂි මගින් පෙන්වා දී ඇත.[26] මෙයින් වඩාත් ම බලපෑමට ලක් වන්නේ අවදානම් සහගත තත්වයන්හි සිටින ළමයින් සහ වැඩිහිටියන් වන අතර, කොවිඩ් වසංගතයෙන් පසුව යළි යථා තත්වයට පත්වෙමින් තිබෙන අවධියේ දී ඔවුන් මානසික

පීඩනය විද්‍යමාන වන ලක්ෂණ අත්විඳිමින්, අන් අය සමග අන්තර්ක්‍රියා කිරීමේ හා නව සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ඇත.[27] අනපේක්ෂිත ලෙස සහ, දීර්ඝ කාලීනව, සීමාවක් නොමැති කාලපරිච්ඡේද සඳහා පාසල් වසා දමන විට, ගුරුවරුන් තමන්ට පැවරී ඇති පරිපාලන සහ විෂයමාලා සැලසුම්කරණ කටයුතු සිදු කරන අතර ම, ළමයින්ට ඉගෙන ගැනීම සඳහා උපකාර කිරීම පිණිස ඔවුන් සමග සම්බන්ධතා පවත්වා ගැනීමේ අභියෝගයට මුහුණ දී සිටිති. පාසල් වසා දමන ලද මුල් කාලයේ දී මෙම තත්වය ගුරුවරුන්ට ඉත්මත ව්‍යාකූල වූ අතර, ඔවුන්ට දැඩි ආතතියකට මුහුණ දීමට සිදු විය.

ගුරුවරු සහ උපදේශකයින් නිතරම උද්‍යෝගයෙන් ම තමන්ගේ ඉගැන්වීමේ සැසි ආරම්භ කර, බොහෝ රෑ වන තුරු අඛණ්ඩව එම කටයුතුවල නිරත වෙති. මෙවැනි කාලසටහන්වල ප්‍රතිඵලයක් ලෙස බොහෝ උසස් පෙළ සිසුන් තම ජෛව ඔරලෝසුවෙහි සිදුවූ වෙනස්කම් හේතුවෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දුන්හ. සිසුන් සම්පූර්ණ රාත්‍රිය ම අවදිව සිටින බවටත්, දිවා කාලය මුළුල්ලෙහි ම නිසි ආහාරයක් හෝ නොමැතිව නිදා සිටින බවටත් දෙමව්පියන් පැමිණිලි කළහ. සිසුන්ගෙන් සමහරෙක් ඔන්ලයින් පංතියට සහභාගී වීම සටහන් කර, එම පංතියට සහභාගී වී සිටින බව අඟවමින් වීඩියෝ දර්ශන නරඹති. නිසි මගපෙන්වීමක් හෝ අධීක්ෂණයක් නොමැති නිසා, සිසුන් තුළ මෙවැනි පුරුදු තිබීම ඔවුන්ගේ කුසලතා පරීක්ෂා කරන අවස්ථාව ද ඇතුළුව ඔවුන්ට ඇතිවන විවිධ ගැටළු නිසා ඔවුන් තුළ මානසික ආතතිය ඇතිවීමට හේතු වේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සාමාන්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් රටා දැඩි ලෙස බලපෑමට ලක්වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සිසුන් තුළ මෙන් ම දෙමව්පියන් තුළ ද එකලෙස මානසික ගැටළු ඇතිවී තිබේ. ළමයින්ගේ ඉගෙනුම් පරිසරයෙහි සිදුවූ හදිසි වෙනස්වීමත් සමග බොහෝ ළමයින් තුළ දොම්නස, නුරුස්නා බව, නින්ද නොයෑම, චිත්තවේගී කැළඹීම, ආහාර පුරුදු වෙනස් වීම, හැසිරීම් රටා වෙනස් වීම වැනි ලක්ෂණ පෙන්නුම් කරන විවිධ වර්ගවල සාංකාවන් ඇති වී තිබේ.[28]

**රාජ්‍ය විශ්වවිද්‍යාලයක කළමනාකරණ සහකාරවරයෙකුගේ ප්‍රකාශය (පිරිමි, වයස අවුරුදු 38, වාලච්චේන, මඩකලපුව)**

"ලොකු ම අභියෝගය වුණේ සංචරණය වීමේ නිදහසයි. රට වසා දැමීමක් නොමැති වුනත්, බොහෝ දෙනෙක් නිවසෙන් පිටව යාමට බියවී සිටිනවා. විශේෂයෙන් ම ළමයින් සහ තරුණයින් බොහෝ ගැටළුවලට මුහුණ දෙනවා. ඔවුන්ට විෂය බාහිර ක්‍රියාකාරකම්වල නියැළීමට ඉඩක් නැහැ. ඒ වගේම, තරුණ තරුණියන් ජංගම දුරකථනවලට ඇබ්බැහි වෙලා. ඔවුන්ගේ නිදාගැනීමේ රටාවන් වෙනස් වෙලා. ඔවුන්ගෙන් සමහරෙක් ජංගම දුරකථනයේ ක්‍රීඩා වලට ඇබ්බැහි වෙලා. ඔවුන්ගේ චින්තන රටාවන් වෙනස් වෙලා."

"මෙම ගැටළුව කෙරෙහි යොමු වී ඇති සැලකිල්ලක් අඩු වන අතර, කිසිවෙකු ඒ ගැන අවධානය යොමු කළේ නැහැ. මානසික සෞඛ්‍ය අංශය මෙහෙය වීමට සෞඛ්‍ය අංශයට ප්‍රමාණවත් ධාරිතාවයක් නැහැ. මගපෙන්වීම් ලබා දීම සඳහා උපකාර කළ හැකි පුද්ගලයින් ද දුෂ්කරතා රැසකට මුහුණ දී සිටිනවා."

## ළමයින් රැකබලා ගැනීමේ අභියෝග

වසංගතයේ පළමු රැල්ල පැවති කාලය අතරතුර දී සමාජ මාධ්‍ය හරහා දැඩි සම්බන්ධතා ගොඩනගාගෙන තිබූ සමහර සිසුන් තමන්ව රවටනු ලැබ හෝ නොමග යවනු ලැබ තිබූ බව දැනගත් විට ඔවුන් තුළ දැඩි දොම්නස සහිත කැළඹීම් ඇති වී තිබෙන බව මනෝ උපදේශකයින් වාර්තා කර තිබේ. එමෙන් ම, ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් පාසල් සිසුන් සියදිවි හානි කර ගැනීම් පිළිබඳව ද මාධ්‍ය වාර්තා පළවී තිබුණි.[29]

තම දරුවන් අන්තර්ජාලයට ඇබ්බැහිවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ කෙසේ දැයි දෙමව්පියන්ට අවබෝධයක් නැත. අන්තර්ජාල ක්‍රීඩාවලට ඇබ්බැහිවීම විවිධ ඥානන කැළඹීම් ඇතිවීමට හේතු වෙයි. රට වසාදැමීම හේතුවෙන් සහ ඔන්ලයින් පංති නිසා තම දරුවන් සිත්තැවුලට පත්වී සිටින බව බොහෝ දෙමව්පියෝ සිතති. තම ජීවිතය එකතැන සිරවී තිබෙන බවක් එම ළමයින්ට හැඟෙයි. රජය මෙම ගැටළු කෙරෙහි අවධානය යොමු කර නොමැති අතර, රජයට එම ගැටළු විසඳීම සඳහා සැලසුම් ද නැත.

ඇතැම් ළමයින්ගේ දෙමව්පියන්ගේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් එම ළමයින්ට ඔන්ලයින් අධ්‍යාපන සැසිවලට සහභාගිවීම සඳහා අවශ්‍ය කරන උපකරණ සපයා දීමට දෙමව්පියන්ට නොහැකි වූ විට ඇතැම් ළමයින් ඔවුන්ගේ දෙමව්පියන් කෙරෙහි කලහකාරී ලෙස හැසිරෙති. එවිට දෙමව්පියන් ද අසරණභාවයට පත්වී එයින් පීඩා විඳිති. මෙය පවුල තුළ සාමය සහ සමගිය නැතිවීමට හේතු වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආතති තත්වයන් වර්ධනය වී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පවා ඇති වේ.[30] පවුල් පරිසරිය කැළඹිලි සහිත වූ විට, එය ළමයින් ඇතුළු පවුලේ සාමාජිකයින්ගේ මානසික සෞඛ්‍යයට බලපෑ හැකිය. බාල පරම්පරාව තුළ බිය සහ දොම්නස ඇතිවීම ඔවුන් අතර මානසික අවපීඩනය සහ සාංකාව පැවතීමට හේතු විය හැකිය. මෙවැනි වාතාවරණයක් තුළ, අනාගත පරම්පරාව උගත් සහ හොඳින් අධ්‍යාපනය ලැබූ පිරිසක් වනු ඇතැයි අපිට අපේක්ෂා කළ නොහැක.

## *අඩු පෝෂණය*

බොහෝ ළමයින් සහ ඔවුන්ගේ දෙමව්පියන් පාසලේ දී නොමිලයේ හෝ අඩු මිලට සපයා දෙනු ලබන සෞඛ්‍ය සම්පන්න සහ පෝෂ්‍යදායී අහාර වේල කෙරෙහි විශ්වාසය තබා සිටිති. බොහෝ ළමයින් මෙම ආහාර වේල නිසා පාසල් පැමිණීමට පෙළඹෙන ග්‍රාමීය ප්‍රදේශවල සහ වැවිලි ආශ්‍රිත ප්‍රදේශවල විශේෂයෙන් ම මෙම තත්වය පවතියි. එහෙත් අවාසනාවට කොවිඩ්-19 වසංගතය පැතිර යාමත් සමග පාසල් වසා දැමීම ළමයින්ට ඔවුන්ගේ අධ්‍යාපනය වෙත ඇති ප්‍රවේශයට පමණක් නොව, පෝෂණය වෙත ඇති ප්‍රවේශයට ද දැඩි ලෙස බලපා තිබේ. 2020 මාර්තු මාසයේ සිට ජනතාව දැඩි මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින බැවින්, තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සහ ආහාර සපයා දීම අතර සමබරතාවයක් පවත්ගැනීමට පවා ඔවුන්ට සිදු වී තිබේ.
රජය අවසානයේ දී රූපවාහිනී සහ ගුවන් විදුලි අධ්‍යාපන නාලිකා හඳුන්වා දුන් නමුත්,[31] සෑම ළමයෙකුට ම ඒ සඳහා එක හා සමාන ප්‍රවේශය හෝ එකම සේවාව සඳහා ප්‍රවේශය නැත.[32] සමහර විද්වතුන් ඔන්ලයින් අධ්‍යාපනයට අදාළව මෙන්ම රූපවාහිනී අධ්‍යාපනයට අදාළව ද පවතින ගැටළු පෙන්වා දී ඇත. ඔන්ලයින් අධ්‍යාපනය සහ දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ බරපතල විවාදයක් ඇති නොවීය. වසංගතයෙහි තුන්වැනි රැල්ල මගින් තවදුරටත් අවහිරතා ඇතිකර තිබෙන අතර, තම අනාගත අපේක්ෂාවන් කිසි දිනෙක ඉටුකර ගැනිමට නොහැකි වෙතැයි යන බිය නිසා ළමයින් තුළ මෙන් ම දෙමව්පියන් තුළ ද ඇති දොම්නස තව දුරටත් වර්ධනය වී තිබේ.

අවම මට්ටමෙන් සිදු කරන ලද ඔන්ලයින් ඉගැන්වීම් පවා ගුරුවරුන්ගේ වැඩ වර්ජනය හෙතුවෙන් නවතා දමා ඇත. ගුරුවරුන්ට සැබෑ දුක්ගැනවිලි තිබෙන අතර ඔවුන්ට ද ඔවුන්ගේ ජීවනෝපාය ආරක්ෂා කර ගැනීමට මූලික අයිතිවාසිකමක් ඇත. නමුත් එම අයිතිවාසිකම දැන් අධ්‍යාපනය සඳහා ළමයින්ට ඇති මූලික අයිතිවාසිකමට එරෙහිව තරග කරයි. එබැවින් බලධාරීන් මෙම කරුණු දෙක කෙරෙහි ම එක හා සමානව අවධානය යොමු කළ යුතු ය.

## *අධ්‍යාපනය මූලික මිනිස් අයිතිවාසිකමක් වේ*

අධ්‍යාපනය මූලික මිනිස් අයිතිවාසිකමක් වන අතර එය අනෙකුත් සියලු ම මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. එය පුද්ගල නිදහස සහ සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කරමින් වැදගත් සංවර්ධන ප්‍රතිලාභ ලබා දෙයි.

අධ්‍යාපනයට ඇති අයිතිය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් පිළිගෙන තිබේ.[33] එහි 26 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය මගින් "*අධ්‍යාපනය මානව පෞරුෂයේ පූර්ණ වර්ධනය අත්කර ගැනීම කෙරෙහි සහ මානව හිමිකම්වලට සහ මූලික නිදහසට ගරු කිරීම ශක්තිමත් කිරීම කෙරෙහි යොමු කරවිය යුතුය ...*" යනුවෙන් විධිවිධාන සලසා තිබේ.

අධ්‍යාපනය සඳහා ඇති අයිතිය මානව අයිතිවාසිකමක් ලෙස ජාත්‍යන්තර සම්මුතීන් කිහිපයක ම පිළිගෙන ඇත. අධ්‍යාපනය සඳහා ඇති අයිතිය පිළිගත් ප්‍රථම ජාත්‍යන්තර සාධනපත්‍රය වූයේ 1960 වර්ෂයේ දී සම්මත කර ගත් 'අධ්‍යාපනයෙහි ඇති වෙනස්කම්වලට එරෙහි යුනෙස්කෝ සම්මුතිය' වේ. මෙම සම්මුතිය අධ්‍යාපනයෙහි ඇති වෙනස්කොට සැලකීම ආමන්ත්‍රණය කරන අතර ම,

අධ්‍යාපනයෙහි සමානාත්මතාවය සඳහා අවස්ථා, ප්‍රාථමික අධ්‍යාපනය වෙත නොමිලයේ ප්‍රවේශ වීම, ද්විතියික අධ්‍යාපනය සඳහා සාමාන්‍ය ප්‍රවේශය, පුද්ගල හැකියාව මත උසස් අධ්‍යාපනය සහ අධ්‍යාපනය සඳහා සුළුතර කණ්ඩායම්වලට ඇති අයිතිවාසිකම් ආදිය ද ආමන්ත්‍රණය කරයි.

පහත සඳහන් සම්මුතීන් මගින් ද අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් ලෙස සහතික කර තිබේ:

(අ) ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය: 13 වැනි සහ 14 වැනි වගන්ති මගින් අධ්‍යාපනය සඳහා ඇති අයිතිය ආරක්ෂා කර තිබේ. "*වර්තමාන සම්මුතියෙහි පාර්ශ්වයක් වන, එහි පාර්ශ්වයක් වන අවස්ථාව වන විට ස්වකීය පාලනය යටතේ පවතින පුරවර ප්‍රදේශවල සහ අනෙකුත් භූමි ප්‍රදේශවල නොමිලයේ අනිවාර්ය ප්‍රාථමික අධ්‍යාපනය සපයා දීම සහතික කිරීමට නොහැකි වී තිබෙන සෑම රාජ්‍ය පාර්ශ්වයක් ම, සියලු දෙනාටම අනිවාර්ය අධ්‍යාපනය නොමිලයේ ලබා දීමේ ප්‍රතිපත්තිය සාධාරණ කාලයක් ඇතුළත සාධනීය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වන විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් වසර දෙකක කාලයක් ඇතුළත සකස් කර අනුගත කර ගැනීමටත්, එකී සාධාරණ කාලය එම සැලැස්මෙහි නියම කර දැක්වීමටත් පොරොන්දු වෙයි.*"[34]යනුවෙන් එහි 14 වැනි වගන්තියෙහි විධිවිධාන සලසා තිබේ.

(ආ) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 1989: *28(1) වැනි වගන්තිය. "රාජ්‍ය පාර්ශ්වයන් අධ්‍යාපනය සඳහා ළමයින්ට ඇති අයිතිය පිළිගන්නා අතර, සාධනීය ලෙස සහ සමාන අවස්ථා පදනමෙන් මෙම අයිතිය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඇතිව, ඔවුන් විශේෂයෙන් ම පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුය: ..."*

(ඇ) සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය, 1966:[35] මෙම සම්මුතියෙහි 18(4) වැනි වගන්තියෙහි දක්වා ඇති පරිදි ළමයින්ට සදාචාර සහ ආගමික අධ්‍යාපනය ලබා දීම සඳහා දෙමව්පියන්ට ඇති නිදහස සහතික කරන විධිවිධානයක් අඩංගු වේ - "*තමන්ගේ අවබෝධයන්ට අනුව තම ළමයින්ට ආගමික සහ සදාචාර අධ්‍යාපනය ලබා දෙන බව සහතික කිරීම සඳහා දෙමව්පියන්ට, සහ අදාළ අවස්ථාවන්හි දී, නීත්‍යානුකූල භාරකරුවන්ට ඇති නිදහසට ගරු කිරීමට වර්තමාන සම්මුතියේ රාජ්‍ය පාර්ශ්ව පොරොන්දු වෙයි.*[36]

(ඈ) සියලු ම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ (1990) 12(4) වැනි වගන්තියෙහි මෙසේ සඳහන් වේ: "තමන්ගේ අවබෝධයන්ට අනුව තම ළමයින්ගේ ආගමික සහ සදාචාර අධ්‍යාපනය සහතික කිරීම සඳහා දෙමව්පියන්ට, අවම වශයෙන් එක් අයෙකු හෝ සංක්‍රමණික සේවකයෙක් වන, සහ, අදාළ අවස්ථාවන්හිදී, නීත්‍යානුකූල භාරකරුවන්ට ඇති නිදහසට ගරු කරන බවට රාජ්‍ය පාර්ශ්වයන් පොරොන්දු වෙයි." එමෙන් ම, 30 වැනි වගන්තිය සහ 45(1) වැනි වගන්තිය සංක්‍රමණික සේවකයින්ගේ ළමයින්ට අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීම සඳහා අයිතිය තිබෙන බව සහතික කරන අනෙකුත් අදාළ වගන්ති වේ.

(ඉ) කාන්තාවන්ට එරෙහි සියලු ආකාරවල වෙනස්කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ සම්මුතිය, 1979: "*ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සහ මැතිවරණ වලට තරග කිරීම සඳහා ඇති අයිතිය ද ඇතුළුව, දේශපාලනයේදී සහ ජන ජීවිතයේ දී මෙන් ම අධ්‍යාපනය සඳහා ද කාන්තාවන්ට සමාන ප්‍රවේශය සහ සමාන අවස්ථා සපයා දෙනු ලබන බව සහතික කිරීම හරහා කාන්තාවන් සහ පිරිමින් අතර සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා පදනම සපයා දෙයි".*[37]

(ඊ) ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (2006) මගින් අධ්‍යාපනය සඳහා ආබාධ සහිත පුද්ගලයින්ට ඇති අයිතිය පිළිගෙන තිබේ. "ඔවුන් පොදු අධ්‍යාපන පද්ධතිය වෙත ප්‍රවේශවීම ප්‍රතික්ෂේප නොකරන බව සහතික කරමින්, සහ ඔවුන්ට නොමිලයේ අන්තර්කරණය වූ, ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සපයා දෙමින්, වෙනස්කොට සැලකීමකින් තොරව සහ සමාන අවස්ථා පදනමින් අධ්‍යාපනය ලැබීම සඳහා ඔවුන්ට ඇති අයිතිය රාජ්‍ය පාර්ශ්ව විසින් පිළිගත යුතුය".

ශ්‍රී ලංකා රජය ඉහත සඳහන් කරන ලද එක්සත් ජාතීන්ගේ සම්මුති සියල්ල අත්සන් කර අපරානුමත කර තිබේ. එබැවින්, මොනයම් වාතාවරණයක් යටතේ හෝ, මොනයම් ආකාරයක හෝ වෙනස්කොට සැලකීමකින් තොරව, අධ්‍යාපනය සඳහා ඇති අයිතිය ද ඇතුළුව, මෙම මානව හිමිකම් ආරක්ෂා කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකා රජය බැඳී සිටියි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තියේ මගපෙන්වීමේ මූලධර්ම තුළ අධ්‍යාපනය සඳහා ඇති සර්වසාධාරණ අයිතිය ඇතුළත් කර තිබේ. ශ්‍රී ලංකාව 1945 වර්ෂයේ සිට ම සියලු ම දෙනාට නොමිලයේ අධ්‍යාපනය ලබා දී ඇති අතර, අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් ලෙස අන්තර්ගත කර නොමැති නමුත්, එය සමාජ ගිවිසුමෙහි අත්‍යාවශ්‍ය කොටසක් වෙයි.[38]

වසර එකහමාරකට වැඩි කාලයක් පුරා බොහෝ ළමයින් අධ්‍යාපනය සඳහා තමන්ට ඇති අයිතිය පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීමට නොහැකිව දැඩි වෙහෙසක් දරමින් සිටි අතර මෙය ඔවුන්ගේ ජීවන අවස්ථා කෙරෙහි ද බලපෑමක් ඇති කරනු ඇත. එමෙන් ම, එය මෙම ගැටළුවට පැහැදිලි පිළිතුරක් නොමැතිව, වසංගතය පැතිරීම මත රඳා පවතින බැවින්, එය රටේ සංවර්ධන අපේක්ෂාවන්ට ද බලපානු ඇත. එම නිසා අදාළ බලධාරීන්ගේ මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කරන ලෙසටත්, සියලු ම පුද්ගලයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීන ආයෝජන සිදු කරන ලෙසටත් අපි රජයෙන් ඉල්ලා සිටින්නෙමු.

උසස් අධ්‍යාපනය සඳහා සහ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් සඳහා රජයට ඇති අපේක්ෂාවන් අපගේ අවධානයට යොමු වී ඇත. මෙය ඉදිකිරීම් සහ මූල්‍ය හා සේවා අංශවල සේවය කිරීමට පුහුණුව සහිත, ඉහළ නිපුණතාවයකින් යුතු ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සහ වරාය නගරය පනත තුළින් පිළිබිඹු වෙයි.

දෙමව්පියන්ට සහ ශිෂ්‍යයින්ට මෙම යථාර්ථයට හැඩගැසීම සඳහා හැකියාව ඇති කිරීම පිණිස වඩා විශාල ආයෝජනයක් සිදු කළ යුතු වේ. මේ අතර ම, ස්ථාපනය වී ඇති අධ්‍යාපන ව්‍යුහයන් ද තවදුරටත් ශක්තිමත් කළ යුතු වේ.

# මූලාශ්‍ර


[1] Burgess S & Sievertsen H.H. (2000). “Schools, skills, and learning: The impact of COVID-19 on education”, *CEPR-Research-based policy analysis and commentary from leading economists,* Available at:https://voxeu.org/article/impact-covid-19-education [Accessed 10th July 2021]

[2] All school in Sri Lankan closed from tomorrow until April 20,2020. Colombopage.com. [Internet]Available at: <http://www.colombopage.com/archive_20A/Mar12_1584022514CH.php> [Accessed 10 July 2021].

[3] New schedules for Schools to Reopen from Aug 10.Ada Derana.[Internet]. July 30, 2020, Available at http://www.adaderana.lk/news/65968/new-schedules-for-schools-to-reopen-from-aug-10

[4] All schools close from August 5th. Adaderana, Sinhala [internet]. August 04, 2020, Available at: http://sinhala.adaderana.lk/news.php?nid=143803

[5] All Universities to be Temporarily Closed over Coronavirus Fears. Ada Derana.[Internet].March 13, 2020, Available at http://www.adaderana.lk/news/61355/all-universities-to-be-temporarily-closed-over-coronavirus-fears

[6] Annual School Census of Sri Lanka, Final Report. Statistics.gov.lk. [Internet] 2020,Available at: <http://www.statistics.gov.lk/Education/StaticalInformation/SchoolCensus/2020> [Accessed 19 July 2021].

[7] 2021 A/L, O/L and Grade 5 Scholarship Exams Postponed. Ada Derana. [Internet]. April 9, 2020, Available at http://www.adaderana.lk/news/72933/2021-al-ol-and-grade-5-scholarship-exams-postponed

[8] De Silva, N. COVID-19 and Online education in Sri Lanka: Can we do it Better? Daily FT. [Internet], 2021, Available at: https://www.ft.lk/opinion/COVID-19-and-online-education-in-Sri-Lanka--Can-we-do-it-better-/14-719254 [Accessed 13 July 2021].

[9] Gangahagedara, Ruchira; Karunarathna, Muditha; Athukorala, Wasantha; Subasinghe, Shyamantha; and Ekanayake, Prabath. Emergency Teaching–Learning Methods (ETLM) during COVID-19: Available at Lessons Learned from Sri Lanka.MDPI.[Internet], September 24, 2021, Available at https://www.mdpi.com/2227-7102/11/10/579/htm

[10] Jayawardena, Eranga. AP Photos: In Sri Lanka, a Dangerous Climb for Online Schools. AP news.[Internet], July 13, 2021, Available at https://apnews.com/article/lifestyle-health-education-coronavirus-pandemic-sri-lanka-6f822d1e3d78314d4505cf1dde747e15

[11] Abayasekara, A. Building a Crisis-Resilient Education System in Sri Lanka. Development Asia. [Internet] 2021. Available at: https://development.asia/insight/building-crisis-resilient-education-system-sri-lanka [Accessed 18 July 2021]

[12] Online Teaching During Pandemic Period a Complete Failure: Teachers’ Service Union. Daily Mirror. [Internet] Nov 23, 2020, Available at https://www.dailymirror.lk/breaking_news/Online-teaching-during-pandemic-period-a-complete-failure-Teachers-Service-Union/108-200373

[13] Jayawardena, Eranga. AP Photos: In Sri Lanka, a Dangerous Climb for Online Schools. AP news.[Internet] July 13, 2021, Available at https://apnews.com/article/lifestyle-health-education-coronavirus-pandemic-sri-lanka-6f822d1e3d78314d4505cf1dde747e15
Jayawardena, Eranga. In Sri Lanka, a Dangerous Climb for online School. Akansas Democrat Gazette. [Internet]. July 17, 2021, Available at
https://www.arkansasonline.com/news/2021/jul/17/in-sri-lanka-a-dangerous-climb-for-online-school/?news

[14] Sri Lankan Children Make a Dangerous Climb for Online School. Aljazeera.[Internet]. July 13, 2021, Available at https://www.aljazeera.com/gallery/2021/7/13/sri-lankan-children-make-a-dangerous-climb-for-online-school

[15] Hayashi, R., Garcia, M., Jayasundara, H. and Hirokawa, T. COVID-19 Impact on Technical and Vocational Education and Training in Sri Lanka. [Internet]. 2021, Asian Development Bank. Available at: https://www.adb.org/publications/covid-19-impact-tvet-training-sri-lanka [Accessed 6 July 2021].

[16] Rameez, A., Fowsar, M. and Noohu, L., Impact of Covid-19 on Higher Education Sectors in Sri Lanka: A Study based on South Eastern University of Sri Lanka. [Internet], 2020, Research Gate. Available at: <https://www.researchgate.net/publication/346095674_Impact_of_Covid-19_on_Higher_Education_Sectors_in_Sri_Lanka_A_study_based_on_South_Eastern_University_of_Sri_Lanka> [Accessed 8 July 2021]

[17] G.C.E.A/L Advance Level Exam. Business News.lk. [Internet] June 24, 2021
https://www.businessnews.lk/tag/g-c-e-a-l-advance-level-exam/ [Accessed 10 September 2021]

[18] A/L Candidates Permitted to Use Non-Programmable Calculators Tomorrow. Business News.lk. [Internet] October 30, 2020, Available at https://www.businessnews.lk/2020/10/30/a-l-candidates-permitted-to-use-nonprogrammable-calculators-tomorrow /
https://www.businessnews.lk/2021/06/24/application-for-a-l-result-re-corrections-only-through-online-department-of-examinations/

[20] Application for A/L Result Re-corrections Only Through Online – Department of Examinations. Daily Mirror.[Internet]. June 24, 2021, Available at
https://www.dailynews.lk/2020/10/20/local/231919/plans-conduct-university-exams-online-ugc-chairman

[21]
https://www.ugc.ac.lk/attachments/2235_Commission%20Circular%20No.11_2020%20English.pdf

[22] Based on the cases reported to the counsellors

[23] Wickremasinghe, Kamanthi. Internet Gaming Disorder: Are We Too Late? Daily Mirror . [Internet]. September 10, 2021, Available at thttps://www.dailymirror.lk/print/medicine/Internet-Gaming-Disorder-Are-we-too-late/308-220057

[24] Fonseka, Piyumi. Porn and Nudes: Delving into Cyber Exploitation in Sri Lanka. Daily Mirror.[Internet].Feb 25, 2021, Available at https://www.dailymirror.lk/news-features/porn-and-nudes-delving-into-cyber-exploitation-in-sri-lanka/131-206532

[25] Wickramasinghe , Kamanthi. Sexual Exploitation of a 15 Year Old Girl: Police Investigations Underway. Daily Mirror. [Internet], July 2, 2021, Available at https://www.dailymirror.lk/recomended-news/Sexual-exploitation-of-a-15-year-old-girl-%3A-Police-investigations-underway/277-215235

[26] Ellepola, A. Foreseeable Psychological Impact of COVID 19 in Sri Lanka. Research Gate. [Internet].Available at: <https://www.researchgate.net/publication/340522703_Foreseeable_psychological_impact_of_COVID_19_in_Sri_Lanka> [Accessed 8 July 2021]

[27] Psychosocial Impact of COVID-19. US National Library of Medicine. [Internet]. Available at https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC7255207/

[28] How is COVID-19 Pandemic Impacting Mental Health of Children and Adolescents? US National Library of Medicine. [Internet], September 10, 2020, Available at https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC7481176/

[29] Grade-10 Student Commits Suicide as He Could Not Log into Online Classes. Daily Mirror.[Internet] Jul 20, 2021, https://srilankamirror.com/news/23918-grade-10-student-commits-suicide-as-he-could-not-log-into-online-classes

[30] Jayaratne, Hiruni. Online Predators: Risk of Exposing Children During Covid. Colombo Telegraph.[Internet] July 16, 2021, Available at 19https://www.colombotelegraph.com/index.php/online-predators-risk-of-exposing-children-during-covid-19/

[31] Waravita, Pamodi. 'Planning Could have Cushioned the Pandemic's Impact on Education.' The Morning. [Internet] July 27, 2021, Available at https://www.themorning.lk/planning-could-have-cushioned-the-pandemics-impact-on-education/

[32] Two Education Channels from Today. Daily News. [Internet] April 20,2020, Available at https://www.dailynews.lk/2020/04/20/local/216800/two-education-channels-today

[33] Universal Declaration of Human Rights. United Nations. [Internet] n.d. Available at: <https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights> [Accessed 8 August 2021].

[34] International Covenant on Economic, Social and Cultural Rights. OHCHR. [Internet] n.d. Available at: <https://www.ohchr.org/en/professionalinterest/pages/cescr.aspx> [Accessed 5 August 2021

[35] International Covenant on Civil and Political Rights. OHCHR. [Internet] n.d. Available at: <https://www.ohchr.org/en/professionalinterest/pages/ccpr.aspx> [Accessed 13 July 2021].

[36] Universal Declaration of Human Rights United Nations. United Nations. [Internet] n.d. Available at: <https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights> [Accessed 8 August 2021].

[37] Treaty bodies. OHCHR [Internet] n.d. Available at: <https://tbinternet.ohchr.org/_layouts/15/TreatyBodyExternal/Treaty.aspx?CountryID=164&Lang=EN> [Accessed 28 July 2021]

[38] 1945 Free Education Policy in Sri Lanka. United Nations. [Internet]. Available at: <https://lk.one.un.org/7060/en/free-education-policy-in-sri-lanka>[Accessed 08 September 2021]